www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ග්‍රීක නය අර්බුදය පන්ති ගැටුමේ නව අවධියක් සංඥා කරයි

## The Greek debt crisis signals a new stage in class conflicts

**හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනයකි**
**2010 මාර්තු 17**

1. ග්‍රීක නය අර්බුදය, 2008 වසරේ එක්සත් ජනපද ලේමන් බ්‍රදර්ස් ආයෝජන බැංකුව බිඳ වැටීමෙන් ' අවුලුවාලූ ගෝලීය ආර්ථික පසුබෑමේ නව අවධියක් සලකුනු කරයි. ලෝකයේ සතර දිග් භාගයේම ආන්ඩු, පරිපූර්න මූල්‍ය බිඳවැටීමක් වලක්වා ගැනීමේ අටියෙන් ඩොලර් ට්‍රිලියන ගනන්, නයෙන් ඉරිතලා ගිය බැංකු වලට පිරිනැමීම මගි න් ඊට ප්‍රතිචාර දැක්වූහ. බැංකු ගලවා ගැනීම සඳහා ගෙවීමේ වගකීම කම්කරුවන් මත පැටවීම මගින් මෙම ආන්ඩු, මූල්‍ය ප්‍රාග්ධනය වෙනුවෙන් පෙනී සිටිති. කම්කරුවන්ගේ ජීවන තත්වයන් පරම්පරා ගනනාවක් පසු පසට ඇද දැමීමේ ඔවුන්ගේ උත්සාහය, යුරෝපයේත් ලෝකය පුරාත් පන්ති ගැටුම ඉමහත් ලෙස පතුරුවා හැරීමට තුඩු දෙනු ඇත. මාර්තු 15 දින නිකුත් කල වාර්තාවකින්, නය වර්ගීකරන ආයතනයක් වන මූඩීස් අනතුරු අඟවා ඇති පරිදි, දැවැන්ත ගෝලීය ආයෝජකයන්ගේ විශ්වාසය රඳවා ගැනීම් වස් ආන්ඩු වලට ගැනීමට බලකෙරී ඇති පියවර ''සමහර අවස්ථාවලදී සමාජීය එකමුතුව පවා ප්‍රශ්නයට බඳුන් කෙරෙන පරිමානයක මූල්‍ය ප්‍රතිසංස්කරන, නොවැලැක්විය හැකි අවශ්‍යතාවක් බවට පත් කරනු ඇත.'' මූඩීස් ප්‍රකාශනය එලි දැක්වූනේ, එක්සත් ජනපදයේ නය, අන්තරාදායක ලෙස ඉහල මට්ටමකට ලඟාවී ඇති බවට අනතුරු ඇඟවූ වාර්තාවක් තුල වීම කැපී පෙනෙයි.

මෙම ජාත්‍යන්තර සන්දර්භය තුල සලකා බලන විට පැහැදිලිව පෙනීයන්නේ, අතිශය බලගතු ගෝලීය බැංකු ආයතන, සමස්ත යුරෝපීය කම්කරු පන්තියටම පාඩමක් වන ආකාරයට, ග්‍රීසිය මූලෝපායිකව වෙන්කර පිහිටුවා ඇති බවයි. අධික නය බරෙන් පෙලෙන, යුරෝපා සංගමයෙන් (ඊයූ) සියයට දෙකක් තරම් කුඩා ආර්ථික අගයක් නියෝජනය කරන ග්‍රීසිය, නියම ඉලක්කයක් බවට පත්ව තිබේ.

යුරෝපීය මහ බැංකුවේ (ඊසීබී) ප්‍රධානී ජීන් ක්ලවුඩේ ට්‍රිචෙට්, දෙසැම්බර් 03 දින උත්තේජක වැඩ සටහන් අවසන් බව නිවේදනය කලේය. පූර්වයෙන්, ආන්ඩු හා කර්මාන්ත අවදානමෙන් මුදාගැනීමට නය සැපයිය හැකිවන පරිදි යුරෝපීය මහ බැංකුව, යුරෝ බිලියන 500ක් බැංකු වලට නිකුත්කර තිබුනි. ට්‍රිචෙට්ගේ ප්‍රකාශයෙන් යන්තම් දින කිහිපයකට පසුව මූල්‍යායතන ග්‍රීසියේ, පෘතුගාලයේ හා ස්පාඤ්ඤයේ නය වර්ගීකරන පහත හෙලීමටත්, බැංකු නය නිකුතුව අත්හිටුවීමටත් පටන් ගත්හ. ෆිනෑන්ෂල් ටයිම්ස් පත්‍රයට අනුව ඔවුන්, ''ග්‍රීසිය අයර්ලන්ත වර්ගයේ කප්පාදු පිලිවෙතකට තල්ලු කිරීම සඳහා'' උත්සුක වූහ. එවකට අයර්ලන්ත ආන්ඩුව, වැඩවර්ජන හා විරෝධතා රැල්ලක් මධ්‍යයේ 2009 මාර්තු මාසයේ සකස්කරගනු ලැබූ කප්පාදු වැඩසටහන ක්‍රියාවට නඟමින් සිටියේය.

ජාත්‍යන්තර ආයෝජකයෝ, ග්‍රීක නය සඳහා පොලිය ඉහල නැංවූ අතර යුරෝවට එරෙහිව සමපේක්ෂනයක නිමග්න වූහ. කුරිරු කප්පාදු ක්‍රියාත්මක කරන ලෙස බලකිරීමට බ්‍රසල්ස්හි, බර්ලින්හි හා පැරිසියේ නිලධාරීහු ඇතන්ස් වෙත ලඟාවූහ. 2008 වසරේදී සිය බැංකු වලට එක් දිනකින් යුරෝ බිලියන සිය ගනන් ලබාදුන් එම යුරෝපීය ආන්ඩුම, ග්‍රීසියේ යුරෝ බිලියන 30ක අයවැය හිඟය සඳහා සැපයීමට මුදල් නොමැති බවත්, එය මුලුමනින්ම කම්කරුවන්ගේ වියදමෙන් පියවා ගත යුතු බවත් අවධාරනය කලහ.

ඒ සඳහා ඔවුන් විශ්වාසය රැඳවූයේ, ග්‍රීක ආන්ඩුවේ බියගුලු අවනතවීම මතය. ''මහා අසමානතාවයක් නිර්මානය කර තිබෙන මේ දැවැන්ත බල සංකේන්ද්‍රනය වෙනස් කිරීම'' පිලිබඳ, 2009 ඔක්තෝබරයේ බලයට පත් ජෝර්ජියස් පැපැන්ඩ්‍රියෝගේ නරුම මැතිවරන පොරොන්දු වේගයෙන් අතහැර දමනු ලැබිනි. කම්කරුවන් මත කප්පාදුව පැටවීම සඳහා හාම්පුතුන් හා වෘත්තීය සමිති සාකච්ඡා වලට එලඹිය යුතු බව ඔහු කියා සිටියේය. ඔහු, ප්‍රධාන කොටම සෞඛ්‍ය පහසුකම් කැපීම තුලින් සමාජ වියදම් සියයට 10කින් පහත හෙලීමට දෙසැම්බර් 27 දින කප්පාදුවේ අයවැයක් අනුමත කර ගත්තේය.

ජනවාරියේදී, ග්‍රීසියේ මෙන්ම තමන්ගේ ද නය ගැනීමේ පිරිවැය ඉහල නැගි තත්වය හමුවේ, ස්පාඤ්ඤ අගමැති ජොසේ ලුවිස් සැපටිරෝගේ හා පෘතුගාල අගමැති ජොසේ සොක්‍රෙටිස්ගේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩු, වේතන, විශ්‍රාම වැටුප් හා මහජන සේවාවන් කැපීමේ සැලසුම් සකස් කලහ.

පෙබරවාරියේදී ග්‍රීසියට ඊයූ හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජාමූඅ) ඇප දීමක හැකියාව පිලිබඳ සාකච්ඡා පැවැත්වෙන අතරතුර, පැපැන්ඩ්‍රියෝ, යුරෝපීය අගනුවරවල සැරි සැරීය. ඇතන්ස් ආන්ඩුව, ඔවුන්ගේ ඉල්ලීම් සපුරාලනු ඇති බවට දේශපාලඥයන්ට මෙන්ම බැංකුකරුවන්ට ද ඔහු සහතික විය. පෙබරවාරි 16 පැවති යුරෝපා සංගමයේ මුදල් ඇමතිවරුන්ගේ රැස්වීමේදී, ග්‍රීක පාර්ලිමේන්තුවේ තීරන හා එහි කප්පාදු වැඩ සටහනේ ප්‍රගතිය පිලිබඳ වාර්තා ග්‍රීක ආන්ඩුව විසින් නිතිපතා ඊයූ හා ඊසීබී වෙත සැපයිය යුතු යයි නියම කරන ලදී.

මාර්තු 05 ඇතන්ස් ආන්ඩුව, නව කප්පාදු වැඩ සටහනක් අනුමත කලේය. එමගින් හිගය තවත් යුරෝ බිලියන 4.8කින් අඩුකිරීම සඳහා රාජ්‍ය අංශයේ වේතන සියයට 10කින් කප්පාදුවක්, විශ්‍රාම වැටුප් කැටි කිරීමක් ක්‍රියාවට නැගුනු අතර, ඉන්ධන, මත්පැන් හා දුම්වැටි මත නිගාමී බදු වැඩිකිරීමක් සම්මත කෙරුනි. සියලු කප්පාදුවල දුෂ්ඨත්වය තිබියේවී නමුත්, පුලුල්ව සැලකුනේ ඒවා ඵලදායී නොවනු ඇති බවයි. *ෆිනෑන්ෂල් ටයිම්ස්* මෙසේ සඳහන් කරයි: ''නපුරු වූවත් ඒවායින්, හිගයේ ඉලක්කය ලෙහෙසියෙන්ම සපුරා ගැනීම අසීරු දෙයක් බවට පත්කල හැකිය. විදේශ වෙලඳමේ ආශ්චර්යමත් වර්ධනයක් නොමැති තතු හමුවේ, ජනතාවගේ ඉල්ලුම එතරම් වේගයෙන් හා ඒ තරම් ප්‍රමානයකින් පහත හෙලීම, බදු පදනමට හානි කරමින් ග්‍රීක ආර්ථිකය හකුලුවාලීමට බැඳීගනු ඇත.''

## කම්කරු පන්තියට එරෙහිව සර්ව යුරෝපීය ප්‍රහාරයක්

2. සමාජ වියදම් හා අයවැය හිඟ කපාහැරීමට ඔබ්බෙහි, මූල්‍ය ප්‍රභූ පැලැන්තියේ ඉලක්කය වශයෙන් ඇත්තේ, කම්කරු පන්තියේ විරුද්ධත්වය කුඩුකල හැකිදැයි උරගා බැලීමයි. ග්‍රීසිය පිලිබඳව ලියමින් *ලේ මොන්ඩේ* පත්‍රය, ප්‍රකාශ කලේ ''මූල්‍ය කවයන් තුල ඇත්තේ, ආන්ඩුව සමාජ බලපෑමට යටත් වේය යන බියයි.'' යුරෝපය පුරා කම්කරුවන් මුහුන දෙන්නේ ආන්ඩුවෙහි සමාජ කප්පාදුවේ සැලසුම් වලට මෙන්ම, මහජන විරෝධයක කොන්දේසි යටතේ බැංකු විසින් නය අත්හිටුවීම පිලිබඳ තර්ජනයටයි.

අයර්ලන්තයේ කප්පාදු වැඩ සටහන දැන් අනෙක් සියල්ලන්ටම ආදර්ශය ලෙස සැලකෙයි. එහි ප්‍රධාන පියවරයන් අතරට රාජ්‍ය අංශයේ වේතන සියයට 12 සිට 22 දක්වා ප්‍රමානයකින් කැපීම, ශුභසාධක ගෙවීම් සියයට 4කින් කැපීම හා ඉන්ධන බදු හා වෛද්‍ය වියදම් සඳහා ජනතාවගේ පසුම්බියෙන් ගෙවිය යුතු මුදල් ඉහල නැංවීමයි.

වැටුප්වල තියුනු කප්පාදුවක්, විශ්‍රාම වැටුප් කප්පාදුව හා අනෙකුත් අයවැය කප්පාදු මෙන්ම රාජ්‍ය ව්‍යවසායන් පුද්ගලීකරනය මගින් 2013 වන විට රටේ අයවැය හිඟය, දල දේශීය නිෂ්පාදිතයෙන් (දදේනි) සියයට 9.3 සිට 3 දක්වා අඩු කිරීමට පෘතුගාලය සැලසුම් කරයි.

ස්පාඤ්ඤය සැලසුම් කරන්නේ, යුරෝ බිලියන 50කින් වියදම් කැපීමටත්, රාජ්‍ය අංශයේ සියලුම බඳවා ගැනීම් අත්හිටුවීමටත්, විශ්‍රාම වයස් සීමාව දෙවසරකින් දීර්ඝ කිරීමට හා වැට් බද්ද ඉහල නැංවීමටත් ය.

රජයේ වියදම් යුරෝ බිලියන 100කින් කපා හරිමින්, තෙවසරක කප්පාදු වැඩසටහනක් පෙබරවාරි මාසයේදී ප්‍රංශය විසින් හඳුන්වා දෙන ලදි. එය, අයවැය හිඟය දදේනි සියයට 8.2 සිට 3 දක්වා අඩුකිරීමට ඉලක්ක කර ඇති අතර, නව විශ්‍රාම වැටුප් කැපීමක් සූදානම් කරමින් සිටියි.

යුරෝපා සංගමයේ අනෙකුත් සාමාජිකයෝ ද ග්‍රීසිය හා සමාන මූල්‍ය ගැටලුවලට මුහුනපා සිටිති. ග්‍රීසිය මෙන් සත් ගුනයක් විශාල ආර්ථිකයක් සහිත ඉතාලිය, යුරෝපීය සංගමයේ ඉහලම, එනම්, දදේනි මෙන් සියයට 116ක් තරම් ඉහල නයගැති මට්ටමකට මුහුන දෙයි.

මහා බ්‍රිතාන්‍යයේ 2009 අයවැය පරතරය පවුම් බිලියන 178ක් නැතහොත් දදේනි මෙන් සියයට 12ක් කරා ලඟා විය හැකි යයි තක්සේරු කෙරී ඇත.

චීනයේ සියයට 40 සමඟ සසඳන කල දදේනි මෙන් සියයට 47ක් වන නිර්යාත මට්ටමක් සහිත ජර්මනිය, ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කරගත්තේ රජයේ සහන සැලසීම මත වැඩ කාලය කෙටි කිරීමෙන්ය. කෙසේ වෙතත්, අර්බුදය මේ වසර තුල වඩාත් දැනෙන්නට පටන් ගනු ඇත. බුන්ඩස්බෑන්ක් (මහබැංකුව) ගනන් බලා ඇති ආකාරයට අයවැය පරතරය 2010 වන විට දදේනි මෙන් සියයට 5ක් දක්වා වැඩිවනු ඇත. බර්ලින් ආන්ඩුව, වාර්ෂික වියදම් යුරෝ බිලියන 10 බැගින් කැපීමට සැලසුම් කරයි. මිලිටරි පිරිවැය හා නය පොලී ගෙවීම් වේගයෙන් ඉහල යද්දී ඉතිරියක් සිදුවිය හැක්කේ සමාජ සේවා කැපීමෙන් පමනි.

## යුරෝපා සංගමයේ භූමිකාව

3. නය අර්බුදය යුරෝපා සංගමයේ ප්‍රතිගාමී ස්වභාවය එලිමහනට පමුනුවා තිබේ. යුරෝපයේ ''සමාජීය වෙලඳපොල ආර්ථිකය'' පිලිබඳ හිස් ප්‍රලාප දොඩවන අතරතුර බ්‍රසල්ස්හි (යුරෝ මධ්‍යස්ථානය) නිලධරයන් ක්‍රියා කරන්නේ, ප්‍රමුඛ මූල්‍ය සංගතවල ඍජු උපකරන ලෙසය.

ජාතිකවාදී ආතතීන් හා නය හරිත යුරෝපීය රටවලට එරෙහි සමපේක්ෂනය, යුරෝපා සංගමයේ මෙන්ම යුරෝ මුදලේ ද අනාගතය ප්‍රශ්නයට බඳුන්කොට තිබේ. සමහර අර්ථශාස්ත්‍රඥයින් ග්‍රීසියට උපදෙස්දී ඇත්තේ, උද්ධමනය තුලින් කම්කරුවන් දුප්පත් කමට හෙලන අතර, ජාතික මුදල අවප්‍රමානය කිරීමෙන් එහි ජාත්‍යන්තර තරගකාරිත්වය අත්කර ගැනීමට උත්සාහ කල හැකිවන පරිදි යුරෝ මුදල අතහැර දමන ලෙසය. නයගැති රටවලට එහි ඇති සම්බන්ධතා කපා හැරීම සඳහා ජර්මනිය, යුරෝව භාවිතා කිරීම නතර කල යුතු බව සමහරු යෝජනා කරති.

අතීතයේදී ජර්මනිය, විශාල මූල්‍ය ප්‍රතිපාදන සපයමින් යුරෝපා සංගමයේ ඒකාග්‍රතාවට හා ව්‍යාප්තියට සහයෝගය දුන්නේය. ඔවුන් සැලකුවේ එය ලාභදායී ආයෝජනයක් ලෙසය. දැන් ග්‍රීසියට මූල්‍යාධාර සැපයීමට එරෙහිව උස් හඬින් කථාකරන රට බවට පත්ව තිබෙන්නේ ද ජර්මනියයි. නාසි යුගයෙන් පසුව අසන්නට නොලැබුන තරමේ උද්ධච්ඡ භාවයකින් ජර්මානු මාධ්‍යයේ සමහර කොටස්, ග්‍රීක ජනතාව දූෂිත හා කම්මැලියයන් පිරිසක් යයි අවලාද නඟති. කම්කරු පන්තියට එරෙහි ප්‍රහාර ක්‍රියාත්මක කිරීමේලා සිය භූමිකාව වසං කිරීම සඳහා ග්‍රීසිය තුලම ජාතිකවාදී බලවේග, ජර්මානු විරෝධී මනෝගතීන් අවුස්සති.

සුද්ඩොච් සෙයිතුං පුවත්පත එම මනෝභාවය මෙසේ කැටිකර දැක්වීය. ''යුරෝ මුදල විසින් යුරෝපය නව ස්වර්නමය යුගයකට ගෙනයනු ඇතැයි සලකනු ලැබුනිඃ එනම්, වර්ධනය, රැකියා හා සෞභාග්‍යයයි. එහෙත් ජර්මානු මුදලට ආයුබෝවන් කීමෙන් දොලොස් වසරක් ගතවූ තැන දැන් පැහැදිලි වන්නේ, පොරොන්දු ඉටුකර නොමැති බවයි. මූල්‍ය සංගමය වෙන කවර කලෙකටත් වඩා දේශපාලන සංගමයෙන් හුදෙකලාවී ඇත -- ඊට ප්‍රතිකූලව එය යුරෝපය කැබලි වලට ඉරා දමයි.''

ජනතාව එකහෙලා විරුද්ධත්වය පලකරන වැඩ සටහන් බැංකු විසින් ඉල්ලා සිටින අතර, යුරෝපීය ධනේශ්වරයේ කොටස් ප්‍රජාතන්ත්‍රවාදී පාලනය අතහැර දැමීම ගැන සලකා බලමින් සිටිති. දැන් බැංකු විසින් ඉලක්ක කර ඇති රටවල් තුනෙහි ම යන්තම් 35 වසරකට පෙර පැවතුනේ ආඥාදායක තන්ත්‍රයන් බව සිහියට නඟාගත යුතුය. 1967-74 අතර කාලයේ නේටෝවේ මුක්කු බලය සහිතව ග්‍රීසිය පාලනය කලේ රුදුරු මිලිටරි ජුන්ටාවක් විසිනි. පෘතුගාලයේ 1926 වසරෙහි පිහිටුවන ලද ෆැසිස්ට්වාදී ආඥාදායකත්වය, 1974 වනතෙක් පෙරලා දැමුනේ නැත. සිවිල් යුද්ධය අවසන්වී වසර 36ක් ගතවීමෙන් අනතුරුව 1975 වසරේ ෆ්‍රැන්කෝ මරනයට පත්වන තෙක් ස්පාඤ්ඤයේ, ෆැසිස්ට් ආඥාදායකත්වයක සිට බටහිර යුරෝපීය වර්ගයේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයක් කරා පරිවර්තනය ආරම්භ වූයේ නැත.

## කම්කරු පන්තියේ ප්‍රතිප්‍රහාරය හා වෘත්තීය සමිතිවල භූමිකාව

4. යුරෝපීය කප්පාදු වැඩසටහන් වලට එරෙහිව කම්කරු පන්තිය, මහාද්වීපය පුරා වැඩ වර්ජන මාලාවක් මගින් ප්‍රතිචාර දැක්වීය. පෙබරවාරි 24 දින ග්‍රීසියේ මිලියන 11ක ජනගහනයෙන් මිලියන 2ක් ජාතික වැඩ වර්ජනයකට සම්බන්ධ විය. මෙය, 1968 ප්‍රංශ මැයි-ජූනි වැඩවර්ජන වලට සහභාගීවූ ජනගහන ප්‍රතිශතයට සමාන ප්‍රමානයකි. මාර්තු 11 දින පැවති වැඩවර්ජනයෙන් යලි වතාවක් රටේ වැඩිහරියක් ඇනහිටවනු ලැබිනි. දෛනිකව සිදුවන විරෝධතා හා වැඩ වර්ජන මඟින් ආර්ථිකයේ සෑම ක්ෂේත්‍රයක්ම අංගවිකල තත්වයකට පත්කලේය.

බැංකු විසින් කෙලින්ම ඉලක්ක කරන ලද අනෙකුත් යුරෝපීය රටවල කම්කරුවෝ ද එවැනිම වර්ජන සටන් ගෙන ගියහ. මාර්තු 04 දින පෘතුගාලයේ ලක්ෂ පහක් කම්කරුවෝ ආන්ඩුවේ කප්පාදු සැලසුම් වලට එරෙහිව වැඩවර්ජනය කලහ. පෙබරවාරි 23 දින ස්පාඤ්ඤයේ දෙලක්ෂයක් යයි ගනන් බලා ඇති කම්කරුවන් සංඛ්‍යාවක් විශ්‍රාමික වයස දෙවසරකින් දීර්ඝ කිරීමේ සැලසුමට එරෙහිව වැඩ වර්ජනය කලේය.

පෙබරවාරි මාසයේ දෙවන භාගය දැකිය හැකි වූයේ ගුවන් යානා ක්ෂේත්‍රයේ සමස්ත යුරෝපීය වැඩ වර්ජනයක ආරම්භයක් ලෙසය. ජර්මනියේදී ලුෆ්තන්සා ගුවන් නියමුවෝ වැඩ වර්ජනයකට අවතීර්න වූහ. ප්‍රංශයේ ගුවන් ගමන් පාලකවරු වර්ජනය කලහ. මහා බ්‍රිතාන්‍යයේ බ්‍රිතාන්‍ය ගුවන් සේවයේ ගුවන් යානා තුල සේවයේ නියුතු කම්කරුවෝ බහුතරයක්ම වැඩවර්ජනය කිරීම සඳහා ඡන්දය දුන්හ.

මෙම ක්‍රියාවන් දිග හැරුනේ දේශපාලන නායකත්වයක් නොමැතිව වුවත්, කප්පාදුවලට එරෙහිව කම්කරු පන්තිය තුල වර්ධනය වන පන්ති වෛරයේ හා සටන්කාමිත්වයේ බලගතු රාශිකරනයක පතිවිඹය එමගින් ගෙන ආවේය. වර්ජන රැල්ලේ ජාත්‍යන්තර ස්වභාවය සලකුනු කලේ කම්කරු පන්ති අවශ්‍යතාවන්ගේ වෛෂයික එකමුතුවයි. වැඩවර්ජන යුරෝපය පුරා පැතිරගියා පමනක් නොව, එය සිදුවූයේ ඇමරිකානු කම්කරු පන්තියේ වර්ධනය වන සටන්කාමිත්වය මධ්‍යයේය. එක්සත් ජනපදයේ බටහිර වෙරල තීර ප්‍රදේශය සංකේන්ද්‍ර කරගත්, අධ්‍යාපන කප්පාදුවට එරෙහි මාර්තු 04 පැවති විරෝධතා, කැපී පෙනුනි.

වේගයෙන් පැතිරගිය වැඩවර්ජන නතර කල හැකි වූයේ, විරෝධතා කොටුකර විසුරුවා හැරීම සඳහා තමන්ට කලහැකි සෑම දෙයක්ම කරන ලද වෘත්තීය

සමිතිවලට පින්සිදුවන්නට ය. වර්ජනයකට අනුමැතිය පලවූ ඡන්දයෙන් පසුව සති ගනනක් යනතෙක් බ්‍රිතාන්‍ය ගුවන් සේවා වෘත්තීය සමිති, වැඩවර්ජනයක් කැඳවීම ප්‍රතික්ෂේප කලහ. ඉන්ධන හිගය පැතිරයාමට පටන් ගැනීමත් සමඟ ප්‍රංශ සීජීටී සමිති ප්‍රංශ තෙල් පරිපහදු වැඩවර්ජන අත්හිටවූහ. චෙකොස්ලොවැකියානු වෘත්තීය සමිති මාර්තු 04 දිනට යොදාගෙන තිබුනු ප්‍රවාහන කම්කරු වැඩවර්ජනය නතර කලහ.

බැංකුවල සමාජ කප්පාදුවට එරෙහි දේශපාලන ව්‍යාපාරයක් ඉස්මතුවීම වැලැක්වීම සඳහා කම්කරු අරගල භේද කිරීමේ වෘත්තීය සමිති පිලිවෙත මෙයින් පිලිබිඹු කෙරෙයි. ''මේ ආන්ඩුව බලයට පත්කිරීමට සහාය දුන් සම්මේලනවල හා වෘත්තීය සමිතිවල අපි, වැඩවර්ජනය කිරීමට කැමැත්තක් නොදක්වමු.'' යයි පෞද්ගලික අංශයේ ජීඑස්ඊඊ සමිතියේ නායක අතිස් ඇනස්ටිස් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* හමුවේ අවංකවම පිලිගත්තේය. ඇනස්ටිස් අවධාරනයෙන් කියා සිටියේ, ඔහුට කප්පාදුව පිලිගැනීමට සිදුව ඇති බවයි. ''ඔබ පිලිගන්නා හා නොපිලිගන්නා දේ රැඳී ඇත්තේ ඔබ මුහුන දෙන තත්වය මතයි. ඔබගේ ගෙලට පිහියක් තබා ඇති කල තත්වය වෙනස්ය.''

මෙම ප්‍රකාශ දේශපාලන තත්වයේ හදවත කරාම ගමන් කරයි: වෘත්තීය සමිති කම්කරුවන්ට එරෙහිව මූල්‍ය වෙලඳපොලවල් සමඟ පෙලගැසී සිටිති. වෘත්තීය සමිති නිලධරය, කම්කරු පන්තිය මත ධනේශ්වරයේ දේශපාලන දඬු අඬුව හිරකරන හා කම්කරුවන්ට දැනුවත්වම සතුරු, ඉහල මධ්‍යම පන්තියේ කොටසක් ලෙස වැඩී ඇති ආකාරය මෙයින් පිලිබිඹු කෙරෙයි.

ව්‍යාපාරවලට ලාභදායී ලෙස කටයුතු කල හැකි ව්‍යාපාරික වාතාවරනයක් නිර්මානය කිරීමත් හාම්පුතුන් සමග ඇතිකරගත් ගිවිසුම් බලාත්මක කිරීමත් පිනිස ඔවුහු රාජ්‍යය මත රැඳී සිටිති. ඔවුහු, බැංකුවල පෞද්ගලික අයිතිය පිලිබඳ මූලධර්මය පිලිගනිති. එබැවින්, බැංකු රජයට අරමුදල් සැපයීම කපාහරින බවට තර්ජනය කල විට, කම්කරුවන් යටත් විය යුතු බවට ඔවුහු බල කරති. කම්කරු පන්තියේ විරෝධය හේතුකොටගෙන බැංකු, රජයට නය සැපයීම කපාහරින්නේ නම් එවිට, ''වගකිවයුතු'' වෘත්තීය සමිති නිලධාරීන්ට කල හැක්කේ, විරෝධතාවන්ට වැට බැඳ ''ඔබ මුහුනදෙන තත්වයට'' ගැලපෙන එනම්, බැංකුවලට පිලිගත හැකි, යෝජනා ගෙනඒම පමනි.

යුරෝපය පුරා වෘත්තීය සමිති ඉටුකරන්නේ එකම ක්‍රියාකලාපයකි. ප්‍රංශ සීජීටී සමිතිය, ''සාර්කෝසි-සීජීටී සන්ධානය'' ලෙස ප්‍රවෘත්ති පත්‍ර සඳහන් කරන ආකාරයට, ජනාධිපති නිකොලායි සාර්කෝසි සමග ඉතා සමීපයෙන් වැඩ කරයි. ජර්මනියේ අයිජී මෙටල් සමිති සභාපති බර්තෝල්ඩ් හුයුබර්, මෑතකදී සිය 60 වන උපන් දිනය සමරනු ලැබුවේ, ඇමතිවරු, ව්‍යාපාරිකයන් හා සමිති ප්‍රධානීන් පරිවරාගත් ඇන්ජෙලා මර්කෙල් චාන්සලර් වරිය සමඟ ඇයගේ නිල මන්දිරයෙහිය. ආන්ඩුව, ව්‍යාපාර හා සමිති එකම සමස්ත සංස්ථාවක් තුලට සංයෝජනය වීම පිලිබඳ මෙතරම් විචිත්‍ර නිදසුනක් සොයාගත නොහැකිය.

## පැසොක් හා සිරිසා ද්‍රෝහිත්වය

5. කිසිවෙකුටත්, යුරෝපයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් ''වම්මුන් ලෙස තව දුරටත් හැඳින්වීම, ධනේශ්වර දේශපාලනයේ භාෂාවෙන් පවා, කල නොහැකිය. ඔවුහු, කම්කරු පන්තියට එරෙහි ප්‍රහාර එල්ල කිරීමට සම්බන්ධ වන, දක්ෂිනාංශික ධනේශ්වර ගැති ප්‍රවනතාවකි. ග්‍රීසියේදී, පැපැන්ඩ්‍රියෝ විසින් පැවති තත්වාරක්ෂක ආන්ඩුව විස්ථාපනය කිරීම සමාජ කප්පාදු සඳහා පූර්වාවශ්‍යතාවක් විය. එය, කප්පාදු වැඩපිලිවෙලට දේශපාලන විකල්පයක් නැතැයි යන වෘත්තීය සමිතිවාදීන්ගේ කියාපෑම වඩා පහසු කලේය.

අවශ්‍ය කප්පාදු ක්‍රියාවට නැගීම තීරනාත්මක බව පෙනීගිය තත්වය හමුවේ, පැපැන්ඩ්‍රියෝ බලයට පත්කිරීම පිලිබඳව ධනේශ්වරය තුල ද්විපාර්ශ්වික සහයෝගයක් පැවති බවට සෑම ඇඟවුමක්ම තිබේ. තත්වාරක්ෂක අගමැති කොස්ටාස් කැරමන්ලිස්, සිය පරාජය නොවැලැක්විය හැකි බව පෙනි පෙනීම පසුගිය සිසිර ඍතුවේදී හදිසි මැතිවරනයක් කැඳවීය. අපේක්ෂිත පරිදිම පැපැන්ඩ්‍රියෝ මැතිවරනය ජයගත්තේ, ව්‍යාජ-වාම පුරසාරම් දොඩමින් සහ යුරෝ බිලියන 3ක ඇපදීමේ වැඩසටනක සැලැස්මක් තමන් සතුව ඇති බවට කියාපාමිනි. බලයට පත්වූ වහාම ඔහු එම ආස්ථාන අතහැර දැමීය.

මෙහිදී පැපැන්ඩ්‍රියෝ කීකරු ලෙස දෝංකාරය නැංවූයේ, ජර්මනියේ හිටපු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී චාන්සලර් ගේහාර්ඩ් ෂ්‍රඩර්ගේ දක්ෂිනාංශික පිලිවෙත්ය. ෂ්‍රඩර් සිය 2010 න්‍යාය පත්‍රයට අනුව, විනාශකාරී සමාජ කප්පාදුව ක්‍රියාවට නගමින්, දැවැන්ත අඩු වැටුප් ක්ෂේත්‍රයක් නිර්මානය කලේය. එසේම පැපැන්ඩ්‍රියෝ, ලේබර් පක්ෂය ලන්ඩන් නගරයේ බැංකුවල අනුමැතිය දිනාගත් මෙවලම බවට පත්කරමින් සිය කප්පාදු වැඩසටහන ක්‍රියාවට නැගූ ටෝනි බ්ලෙයාර් අනුගමනය කලේය. යුරෝපය පුරා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල කෙරුවාව එවැනිය.

වෘත්තීය සමිති හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරනවාදයේ දඬු අඬුවෙන් බිඳීගැනීමේදී කම්කරුවන් මුහුනදෙන ප්‍රධාන බාධකය වන්නේ, ග්‍රීසියේ සිරිසා, ජර්මනියේ ඩයි ලින්කෙ හා ප්‍රංශයේ එන්පීඒ යන නව ධනේශ්වර විරෝධී පක්ෂය වැනි හිටපු-වාම පක්ෂ ස්ථරයන්ය. ස්ටැලින්වාදී හෝ පැබ්ලෝවාදී පසුබිමක් සහිත, රාජ්‍ය යාන්ත්‍රනයේ හා වෘත්තිමය පන්තිවල කොටස් වෙතින් ඇදගනු ලැබූ ඔවුන්ට, කම්කරු පන්තිය පවත්නා නිලධරය පිටුපස

දැක්කීමේ දශක ගනනාවක අත්දැකීම් සතුය. ඔවුන්ගේ සීමිත මැතිවරන ජයග්‍රහන තිබියේවී නමුත්, ධනේශ්වර දේශපාලනය තුල ඔවුහු තීරනාත්මක භූමිකාවක් ඉටු කරති.

වෘත්තීය සමිති විසින් මෙහෙයවන ලද එක් දින වැඩවර්ජන මාර්ගයෙන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය, වෙනත් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සඳහා ඒත්තුගැන්විය හැකිය යන ව්‍යාජ අපේක්ෂාව මෙම කන්ඩායම් විසින් නරුම ප්‍රචලිත කරනු ලබයි. පැපැන්ඩ්‍රියෝ බලයට පත්වීම ගැන ඔහුට දුරකථනයෙන් සිය සතුට පලකල සිරිසා නායක ඇලෙක්සිස් ට්සිප්‍රාස් තමන්ගේ වාචික ප්‍රකාශ අංශක 180කින් ආපසු කරකවා තිබේ. ඔහු මැතකදී, පැපැන්ඩ්‍රියෝගේ පියවර ''අසාධාරන, රුදුරු හා සාපරාධී'' යයි හෙලාදැක තිබේ. කෙසේ වෙතත් ඉන් පසුව ඔහු පැමිනිලි කලේ, පැපැන්ඩ්‍රියෝ ආන්ඩුව එහි ''සමාජවාදී දෘෂ්ඨිය අතහැර දමා'' ඇතැයි යනුවෙනි. ඉන්පසුව ඔහු වෘත්තීය සමිති සමග ඒකාබද්ධ අරගලයක් කැඳවුම් කරයි.

එවන් ප්‍රකාශ මඟින් සලකුනු කෙරෙන්නේ ට්සිප්‍රාස්ගේ සුලු ධනපති දේශපාලනයේ වංකභාවයයි. පැපැන්ඩ්‍රියෝ වැනි බැංකුවල ඒජන්තයෙකු සතුව, අතහැර දැමීමට තරම්වූ කිසියම් ''සමාජවාදී දෘෂ්ටියක්'' හෝ සමිති නායකයන්ට සැබෑ අරගලයක් සඳහා සැලසුම් හෝ ඇතැයි කියා සිටීම අමූලික බොරුවකි.

## යුරෝපීය සුලු ධනපති ''වම්මුන්ගේ'' ක්‍රියාකලාපය

6. කෙසේ වෙතත් මෙම ආස්ථානයන්, යුරෝපීය හිටපු-වම්මු ද පොදුවේ බෙදාහදා ගනිති. විශ්‍රාම වැටුප් කපාහැරීම පිලිබඳව සාකෝසි හා සීජීටී අතර පෙබරවාරි 15 දින පැවැත්වීමට තිබුනු සාකච්ඡා අතරතුර, විශ්‍රාම අයිතීන් රැකගැනීම සඳහා සහාය දෙන ලෙස, ඒවන විටත් විශ්‍රාම වයස් සීමාව දීර්ඝ කිරීම සඳහා කැඳවුම්කර සිටි ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂයේ නායක මේරි ජෝර්ජස් බුෆේගෙන් හා සමාජවාදී පක්ෂයේ නායක මාටින් ඕබ්‍රිගෙන්, එන්පීඒ නායක ඔලිවර් බෙසන්සිනොට් ඉල්ලා සිටියේය෴

ස්පාඤ්ඤයේ එක්සත් වමේ ( අයියු), ප්‍රකාශකයා වන ඇඩොල්ෆෝ බැරීනා කියා සිටියේ, සැපටීරෝ ''යලිත් වම දෙස බලනු ඇතැයි'' තමන් අපේක්ෂා කරන බවයි. සැපටීරෝගේ කප්පාදු ''ක්‍රියාවට නැගෙන්නේ නුසුදුසු වෙලාවේ හා නුසුදුසු ආකාරයට'' යයි මැසිවිලි නගමින්, ඒ පිලිබඳව මූලධර්මාත්මක විරුද්ධත්වයක් තමන්ට නැතැයි යූජීටී ප්‍රකාශක ජූලියන් ලෝරිස් පැහැදිලිව කියා තිබියදී පවා බැරීනා, විශ්‍රාම කැපීමට එරෙහිව යූජීටී පෙලපාලියට සිය සහයෝගය දෙන බව සඳහන් කලේය.

ප්‍රවේශම්සහගත වාක්‍ය පිටුපස සැඟවෙන අතරතුර මෙම පක්ෂ, සමාජ කප්පාදුවේ අවශ්‍යතාව පිලිගෙන සිටිති. ඔවුන්ගේ පොදු ඉදිරිදර්ශනය වන්නේ, නය අර්බුදයට පෙරාතුව අනුගමනය කල ලිහිල් මූල්‍ය ප්‍රතිපත්ති කරා යලි පැමිනෙන ලෙස ධනේශ්වරය ඒත්තු ගැන්විය හැකි නම්, කප්පාදු කරන ලද ශුභසාධක රාජ්‍යයේ සැකිල්ල බේරාගත හැකි බවයි. මෙම තත්වය, යුරෝපා සංගමයේ වියදම් ඉහල නැංවීම හා යුරෝපීය මහ බැංකුව දේශපාලනිකව පරිපාලනය කිරීම වැනි යුරෝපා සංගමය ප්‍රතිසංස්කරනය සඳහා කරන කැඳවුම් සමග එක පෙලට පිහිටා සිටියි.

2010 ජනවාරියේ බර්ලින්හි පැවති යුරෝපීය වමේ සභාපතිවරුන්ගේ මන්ඩලය හමුවේ කථාකරමින් ට්සිප්‍රාස් යෝජනා කලේ, ''මෙම උන්මත්තක ස්ථායීකරන ගිවිසුමට එරෙහිවත යුරෝපීය මහ බැංකුවේ මහජන පාලනයත  සාමාජික රටවලට ඍජු ලෙස නය දීමේ හැකියාව හා යුරෝපීය බැඳුම්කර හඳුන්වා දීම.... එක්සත්කමක් නොමැතිකම ජයගැනීම සඳහා යුරෝපීය අයවැයට යලි ශක්තිය ලබාදෙන සමාජ සාධාරනත්වය, එක්සත්කම හා තිරසාරභාවයේ ගිවිසුමකි.''

පසුගිය වසරේදී එන්පීඒ හි ෆ්‍රැන්සිස් සැබාඩෝ වඩාත් ඍජු ලෙස ලේඛනගත කලේ: ''කේනිසියානු ඇපදීමේ ප්‍රතිපත්තියක සන්දර්භය යුරෝපයට අන්තර්ගත කරගත හැකිය යනුවෙනි. කෙසේ වෙතත්, යුරෝපා සංගමයේ ප්‍රතිපත්ති පෙන්නුම් කරන්නේ ආධිපත්‍ය දරන පන්ති එවන් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට දක්වන නොසමත්කමයි.... ඔවුහු, නව මූල්‍ය ප්‍රතිමාන හඳුන්වා දීමට හෝ ආර්ථික කටයුතු පනගැන්වීම සඳහා එලදායී ලෙස නය පාලනය කිරීමට අදහස් නොකරති.'' සැබාඩෝ, ''යුරෝපීය මහබැංකුවේ ස්වාධීනත්වය අවසන් කල යුතු'' බව කියා සිටියේය.

එවන් යෝජනා තර්කාන්විත නොවනවා පමනක් නොව, ප්‍රතිගාමී ද වේ. නිෂ්පාදනයේ පුනර්ජීවනයක් නොමැති කල, බැංකුවලට ඇපදීම මෙන්ම සීමිත ශුභසාධන ගෙවීම්  සඳහා ද මුදල් අච්චුගැසීම අවසානයේදී උද්ධමනය හරහා කම්කරුවන් දුගී භාවයට ඇද හෙලයි. සියල්ලටමත් වඩා මෙම යෝජනා, ප්‍රධාන ප්‍රශ්නය මගහරියිත බැංකු, නිෂ්පාදනය හා රාජ්‍ය බලය සියතට ගැනීමෙන් තොරව කම්කරුවන්ට සිය ජීවන තත්වයන් රැකගත හැකි ද? ප්‍රශ්නයට පිලිතුරු නොදී ''රැඩිකල්වාදීන්'' හෝ ''ධනේශ්වර විරෝධීන්'' ලෙස පෙනී සිටීමට හිටපු වම්මුන් දරන උත්සාහයත් සමග මෙය බැඳී ඇතත (එනම්) විප්ලවවාදී සමාජවාදය සඳහා ද, එයට එදිරිව ද?

සත්‍ය වශයෙන්ම මේ පක්ෂ, කම්කරු පන්ති විරෝධී ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීම සඳහා ආන්ඩුවලට ඇතුලුවීමට කැමැත්තක් දක්වති. හොඳම අත්දැකීම

රිෆොන්ඩේසියොනි කොමියුනිස්ටාව 2006-08 ඉතාලියේ ප්‍රෝඩි ආන්ඩුවේ සිටිමින් විශ්‍රාම කැපීමටත්, ඇෆ්ගනිස්ථානයට හමුදා යැවීමටත් අවශ්‍යවම තිබුනු ඡන්දය ලබාදීමයි. මේ හිටපු වම්මු වැඩිම වුනොත් බැංකුවල වාමාංශයයි.

## සමාජවාදී ක්‍රියාමාර්ගයක් සඳහා

7. මූල්‍ය ප්‍රාග්ධනය හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදය, කප්පාදු වැඩපිලිවෙල ඉදිරියට තල්ලු කරන්නේ ඔවුන්ගේ ශක්තිය නිසා නොව, කම්කරු පන්තික පක්ෂ නොමැතිවීම නිසාය. වෘත්තීය සමිතිවල හා හිටපු වම්මුන්ගේ මුසාවාද මගින් මහජන විරුද්ධත්වය ව්‍යාකූල හා පක්ෂඝාත කර තිබේ. යුරෝපය දුගී භාවයට හෙලීමේ ධනේශ්වර සැලසුම්වලට එරෙහි අරගලය, සියලු ආකාරයේ ස්ටැලින්වාදි හා අවස්ථාවාදී රූපාකාරයන්ගෙන් බිඳී වෙන්වීමක් ඉල්ලා සිටියි.

තමන්ගේම දේශපාලන උරුමය වටහා ගැනීමෙන් කම්කරුවන් වලක්වාලීමේ උපායක් වශයෙන් හිටපු වම්මු, සමාජවාදය වටා මුසාවේ දුමාරයක් නිර්මානය කර තිබේ. කම්කරුවන්ට, සමාජ කප්පාදුවට සමාජවාදී විරුද්ධ පක්ෂයක් වර්ධනය කරගත හැකිවන ආකාරයට ආස්ථානයන් ගෙනහැර දැක්වෙන පහත සඳහන් ඉල්ලීම්, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (හජාජාක) ඉදිරිපත් කරයි.

* දොට්ට දැමීම් හෝ ක්‍රය ශක්තිය අහිමිකිරීම් එපා

මූල්‍ය ප්‍රාග්ධනය හා එහි සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා හිටපු වාම ඒජන්තයින් මුදල් නොමැති බවට කරන ප්‍රකාශ බොරු ය. නිර්කාර්මිකකරනයේ හා කප්පාදුවේ දශක ගනනාවක් තුලින් කම්කරු පන්තියෙන් මුදල් කොල්ලකාගෙන තිබේ. අරමුදල් යෙදවිය යුත්තේ ප්‍රාග්ධනයේ ලාභාවශ්‍යතාවන් සඳහා නොව කම්කරුවන්ගේ සමාජ අවශ්‍යතා වෙනුවෙන්ය.

* බැංකු ජනසතු කරනු

කම්කරු පන්ති අවශ්‍යතාවන්ගේ ඉතාමත් මූලික ආරක්ෂාව සැලසීම සඳහා බැංකු පොදු පාලනයක් යටතට ගෙන ආ යුතුය. පුද්ගලයන් අතෙහි පවතින බැංකු, සිය කැමැත්ත පරිදි රටවල් විනාශ කරමින් ද සිය දේශපාලන ආසක්තයන්ට අනුව පොලි අනුපාතිකයන් ඉහල නැංවීමේ අරමුනෙන් නය සීමාකරමින් ද කර්මාන්ත අරමුදල් හිඟයෙන් පෙලමින් ද ''තරගකාරිත්වයේ'' නාමයෙන් ජීවන තත්වයන්ගේ සාර්වත්‍රික පහතට නැඹුරුවූ සර්පිලයක් අධීක්ෂනය කරමින් ද ක්‍රියාත්මක වෙයි. නිෂ්පාදනයේ හා වෙලඳමේ වර්ධනය සඳහා අරමුදල් සම්පාදනය කරමින් එහි කාර්ය සාධනය ඇතිකිරීමට නම් මූල්‍ය කර්මාන්තය පෞද්ගලික අයිතියේ හස්තයෙන් ගලවාගෙන කම්කරුවන්ගේ පාලනය යටතේ තැබිය යුතුය.

* හිටපු-වම්මුන් කෙරෙහි විශ්වාසය නොතබනු. විප්ලවවාදී සමාජවාදය සඳහා

ආර්ථිකයේ මෙහෙයුම් මධ්‍යස්ථානවල පෞද්ගලික අයිතිය පිලිබඳ මූලධර්මය යල් පිනූ බවට පත්වීම පෙන්නුම් කරන්නේ, සමාජවාදයේ අවශ්‍යතාවයි. කෙසේ වෙතත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදයෙන්, වෘත්තීය සමිති වලින් හා ඔවුන්ගේ හිටපු-වාම ක්ෂමාලාපකයන්ගෙන් නොබිඳෙන තාක් දුරට කම්කරුවන්, බැංකුවල අනසකට හිසේ සිට දෙපතුල දක්වාම බැඳී සිටිනු ඇත. බලය සඳහා අරගලයේදී විප්ලවවාදී සමාජවාදී පක්ෂ ගොඩනැගීම හැරෙන්නට වෙනත් විකල්පයක් ඇත්තේ නැත. බැංකු හා මහා කර්මාන්ත ජනසතු කිරීම, මහජනතාවන්ගේ අවශ්‍යතාවන් වෙනුවෙන් සේවය කරනු ඇත්තේ රාජ්‍ය බලය කම්කරු පන්තිය අත පවතින්නේ නම් පමනි. කම්කරුවන්ට, පුද්ගලික කතිපයාධිකාරයෙකු කෙරෙහි තබනවාට වඩා වැඩි විශ්වාසයක් මූල්‍ය කතිපයාධිකාරයේ ආන්ඩුවක් කෙරෙහි තැබීමට තව දුරටත් පුලුවන් කමක් නැත.

* යුරෝපීය සමාජවාදී සමූහාන්ඩු සංගමයක් සඳහා

යුරෝපය තුල වර්ධනය වන ආතතීන් හා යුරෝව බිඳීයාමේ විභවය පිලිබඳ සාකච්ඡා පෙන්නුම් කරන්නේ, යුරෝපා සංගමය පිලිබඳ ව්‍යාපෘතියේ බංකොලොත්කමයි. යුරෝපීය ආර්ථික කන්ඩායම් අතර වෙලඳ යුද්ධය හා අවසානයේදී යුද්ධයම සඳහා පදනම සපයන විනාශකාරී යුරෝපීය බෝල්කනීකරනයකට එයින් තර්ජනය කෙරෙයි. යුරෝපීය කම්රුවන් ඊට පිලිතුරු දිය යුත්තේ, ලෝක සමාජවාදය ගොඩනැගීම දෙසට තබන පියවරක් ලෙස, කම්කරු රාජ්‍යයන්ගේ එක්සත් යුරෝපීය ආන්ඩුවක් සඳහා ජාත්‍යන්තර අරගලයකින් ය.

යුද්ධයට සතයක් නොදෙනු

ඇෆ්ගනිස්ථානයේ නේටෝ යුද්ධය වැනි විදේශ යුද්ධ, කම්කරුවන් අන්ත දක්ෂිනාංශික ජාතිවාදයෙන් හා සංක්‍රමනික විරෝධී වෛරයෙන් බෙදා වෙන්කරන විසකුරු දේශපාලන වාතාවරනයක් අවුලුවාලයි. යලි යලිත් සිදුකරන අපරාධවලට අමතරව මෙම යුද්ධ, හදිසියෙන්ම අවශ්‍ය කෙරී තිබෙන සමාජ සම්පත් ගිල දමයි. යුරෝපීය කම්කරු පන්තියේ එක්සත්කමත්, මුස්ලිම් රටවල හා එක්සත් ජනපදයේ කම්කරුවන් සමග දේශපාලන සහයෝගීතාවයත්, ගොඩනැගීම සඳහා ඒවාට විරුද්ධ වීම අත්‍යවශ්‍යය.

## හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගොඩනගනු

8. යුරෝපයේ දේශපාලන හා ආර්ථික තත්වය, කම්කරු පන්ති නායකත්වයේ අර්බුදයේ ගැඹුර තියුනු ලෙස ඉස්මතුකර දක්වයි. සෑම රටකම කම්කරුවන්ගේ

ඉරනම රැඳී ඇත්තේ මූල්‍ය ප්‍රභූ පැලැන්තියේ අවශ්‍යතාවන්ට අනුකූලව දැනුවත්ව කටයුතු කරන ප්‍රතිගාමී සුලු ධනපති සංවිධාන අතය. ඔවුන්ගේ වාචාල පුරසාරම් නොතකාම, හිටපු ස්ටැලින්වාදීන්, හිටපු සමාජවාදීන්, හිටපු මාක්ස්වාදීන්, හිටපු රැඩිකලුන් හා හිටපු ප්‍රතිසංස්කරනවාදීන් පවා, නායකත්වය දෙන මේ පැරනි සංවිධාන සැමෙකක්ම දේශපාලනිකව ක්‍රියා කරන්නේ, සංගතවල, බැංකුවල හා ධනපති රාජ්‍යයේ ඒජන්තයන් ලෙසය. ඒ කිසිවෙක් ධනේශ්වර රාජ්‍යයෙන් ස්වාධීන නැත. පැසොක්, සිරිසා, විවිධ සමාජවාදී පක්ෂ හා එන්ජීඕ වැනි රැවටිලිකාර වාම නාටක රඟදක්වනනන් යන සියල්ලෝ ම දේශපාලනිකව ඇට මිදුලු දක්වාම කුනුවී ඇත. ඔවුන් ''අවස්ථාවාදීන්'' ලෙස හැඳින්වීම ඔවුන්ට ලැබෙන තුටු පඬුරක් වනු ඇත. එය, දිගුකාලීන විප්ලවවාදී ආසක්තයන් කෙටිකාලීන ප්‍රතිසංස්කරනවාදී අරමුනු වෙනුවෙන් යටත් කිරීම වෙනුවෙන් යොදන පදයක් වන අතර, එය අයත් වන්නේ වෙනත් ඓතිහාසික අවධියකටය. අද දිනයේ මෙම සංවිධානවල අංගලක්ෂනය සමාජවාදී ක්‍රියාමාර්ගයක් ප්‍රතික්ෂේප කිරීම පමනක් නොව, කම්කරු පන්තියේ අති මූලික ආසක්තයන් කිසිවක් පවා ආරක්ෂා නොකිරීමයි. ධනපති දේශපාලන සංස්ථාපිතයේ ''වම්'' ඇලපත ලෙස හැර අන් කිසිවක් ලෙසින් කටයුතු නොකරන, මෙම සුලු ධනපති සංවිධානවල දේශපාලන අනසක යටතේ කම්කරු පන්තිය පවතිනා තාක් දුරට, ඔවුන් එකකින් පසුව තවෙකක් වශයෙන් පරාජයන්ට මුහුන දෙනු ඇත.

එබැවින් ග්‍රීසියේ, යුරෝපයේ හා ලෝකය පුරාම කම්කරු පන්තිය මුහුනදී සිටින ඉතාමත් හදිසි කර්තව්‍යය වන්නේ, ජාත්‍යන්තර සමාජවාදී මූලධර්ම මත පදනම්වූ නව විප්ලවවාදී දේශපාලන පක්ෂයක් ගොඩනැගීමයි. ධනේශ්වර සූරාකෑමට, දුප්පත්කමට හා යුද්ධයට එරෙහි අරගලය තුල කම්කරු පන්තිය සංවිධානය කර ඒකාබද්ධ කිරීමට උත්සුක වන එකම දේශපාලන සංවිධානය වන්නේ, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පමනි. නූතන කම්කරු පන්තිය මුහුනපා සිටින සියලු දුෂ්කර ගැටලු තිබියදීම එය, මෙම ග්‍රහලෝකය මත සිටින එකම අත්‍යවශ්‍ය හා තීරනාත්මක විප්ලවවාදී බලවේගය වන්නේය. වර්තමාන ලෝක අර්බුදය විසින්, පෘතුවි ගෝලයේ අස්සක් මුල්ලක් නෑර පෙර නොවූ විරූ තරම් කම්කරු ජනතාවකට, ධනවාදයට එරෙහි අරගලය තුලට ඇතුලුවීමට බලකෙරෙනු ඇත. විප්ලවවාදී අරගලයන්ගේ නව අවධියක් දැන් ආරම්භවී ඇතැයි හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ඒත්තුගෙන සිටියි. එය, කම්කරු පන්තියේ අරගල වාර්තා කිරීමේ, එක්සත් කිරීමේ හා දේශපාලන නායකත්වය සම්පාදනය කිරීමේ දේශපාලන මෙවලම ලෙස *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* නිර්මානය කර තිබේ. මාක්ස්වාදී හා ට්‍රොට්ස්කිවාදී මූලධර්ම ආරක්ෂා කිරීම සඳහා දශක ගනනාවක් ගෙනගිය අරගලයේදී ජාත්‍යන්තර කමිටුව, දැවැන්ත දේශපාලන අත්දැකීම් සම්භාරයක් සතුකරගෙන සිටියි.

දේශපාලනිකව වඩාත් සවිඥානක කම්කරුවන්ට, බුද්ධිමතුන්ට හා තරුනයන්ට, මෙම ප්‍රකාශනය තුල විස්තාරනය කර තිබෙන ඉදිරිදර්ශනය සඳහා සටන් වදින ලෙසත් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට බැඳෙන ලෙසත් එය කැඳවුම් කරයි.

**2010 මාර්තු 17**

© www.wsws.org